# සමසරාගිකත්වයට වැට නොබඳිමු

ලෝකය සුන්දර වෙලා තියෙන්නෙ මිනිසුන්ගෙ තියෙන විවිධත්වය නිසයි. එය සමාජයට හානිකර දෙයක් නොවෙයි. ඒ වගෙම සමාජයක් සුන්දර (ශිෂ්ටසම්පන්න) වෙන්නෙත් මේ වෙනස්කම්වලට විවිධත්වයට ගරු කරන, ඉඩදෙන තරමටයි. මේ විවිධත්වය දේශපාලනය තුල ද ආගම තුල ද නැතිනම් ආදරය සහ ලිංගිකත්වය තුල ද යන්න වැදගත් නැහැ. සදාචාරවත් පුද්ගලයා කරන්නෙ මේ හැමටම ගරු කිරීම. මේ අතින් අපි හරිම නොදියුනුයි. අසංස්කෘතිකයි. '*අපි අපේ ජීවිතයෙ අනික් හැමතැනදිම විවිධත්වයට ඉඩදුන්නත් ලිංගිකත්වය තුල හැමදෙනාම එකම විලාසිතාවක් අනුගමනය යුතු යැයි සිතන බව*'[1] කියා තිවුනේ ක්ලිටෝරිස් ඩොට් කොම්[2] නමින් පැවතුනු වෙබ් අඩවියක්. මේ කතාව වත්මන් සිංහල සමාජයට හරි අපූරුවට සැසඳෙනව. ආදරය හෝ ලිංගික සබඳතා විරුද්ධ ලිංගිකයන් අතර වගේම සමලිංගිකයන් අතර සිදුවීමත් ස්වාභාවික දෙයක්. එය තවත් එක මානුශික සබඳතාවක්. නමුත් අපි එය දකින්නෙ විකුර්ති ආශාවක් නිසා ඇතිවන වනචර කායික හැසිරීම් වෙසෙසක් විදියට. සමලිංගිකයන් අතර ඇති මානසික බැඳීම් අමතක කරලා ඔවුන්ට අනන්‍ය කාමචර්යා සහ ඒ ආශ්‍රිත අවදානම් තත්ව විතරක් පෙරට අරගෙන.

යම් තැනැත්තියකගෙ ලිංගික අනන්‍යතාවය විශමලිංගිකත්වයෙන් බැහැර සුලුතර ලිංගික අනන්‍යතාවයක් වුවත් එයට වැටකොටු බඳින්ටවත්, ගරහන්ටවත් බාහිර සමාජයට ඇති අයිතියක් නැහැ. එය වරදක් නොවෙනවා වගේම පහත් නිහීන තත්වයකුත් නෙවෙයි. තමන්ගෙන් බැහැර ආගමකට ජාතියකට අනුව ජීවිතය ගෙනියන්ට කෙනකුට අයිතියක් ඇත්තා වාගෙම තමන් ආසකරන ලිංගික අනන්‍යතාවකට අනුව සිය දිවිය ගෙනියන්ටත් ඕනෙම කෙනෙකුට ඉඩකඩ ලබා දීම සදාචාර විරෝධී හෝ අසංස්කෘතික විය නොහැකියි. තමන්ගේ ලිංගික අනන්‍යතාවය උත්ක්‍රුශ්ට යමක් ලෙස දකිමින් අන් අයගේ ජීවන විලාසිතාවන්ට නෛතික ඉඩ නොදිය යුතු වග කියන විශමලිංගපරමවාදී අශිශ්ටයනුයි මටනම් හැබෑම සදාචාර විරෝධීන් හැටියට පෙනෙන්නෙ. ඇත්තටම අන් අයගේ ලිංගික අනන්‍යතාවයට ගරහන අයත් අන් අයගේ (ආගම ජාතිය වගේ) සංස්කෘතික අනන්‍යතාවයන්ට ගරහන අයත් අතර සංකල්පීයව ලොකු වෙනසක් නැහැ.

නොවැලැක්විය හැකි පෛවීය හෝ මනෝවිද්‍යාත්මක තත්වයක් සහිත අයකුට සංස්කෘතිකමය තත්වයන් මත දුක්විඳින්න ඉඩදීම හරිම අමානුශිකයි. මේ අයට තීන නීතිමය වැටකඩොලු උගුලන එක අතිශය වැදගත් ප්‍රජාතාන්ත්‍රික පියවරක් වෙන්නෙ ඒකයි. නමුත් සමාජයේ ප්‍රතිචාරය එතරම් සුබවාදී බවක් පේන්න නැහැ. මේ ගැන හරිම අපූරු තර්කයක් එක්තරා නීතිඥයෙක් ඉදිරිපත් කරනවා මම අහගෙන- ඒ ගැන මානව හිමිකම් කොමිසමේ අධ්‍යක්ශකවරිය කියූ කථාවක් ඔහුගෙ සරදමට බඳුන් වුනේ මේ විදියට ..... "*මානව හිමිකම් කොමිසමේ අධ්‍යක්ශකවරිය කියනවා ලංකාවේ සෑහෙන පිරිසක් සමලිංගිකත්වය නීතිගත නොවීම නිසා විශාල මානසික අවපීඩනයකින් ඉන්නවලු. අපි මේ ලංකාව වටේම පංති කර කර යනවා, අනේ මටනං එහෙම කට්ටියක් හම්බවෙලා නෑ. ඔය කොහෙහරි ගුබ්බෑයක උං ඒ අසමජ්ජාති වැඩ කරගන්නැතෑ...*" ඔහුගෙ මේ කතාවට මගේ පිලිතුර මෙයයි. **එක මිනිහෙක් කියන්නෙ ලොකු සෙනගක් !**

- **සචින්ත මදුශාන්**

---

1. "While we accept diversity in other areas of our lives, When it comes to sex there is often an expectation of sameness."

2. *මෙම වෙබ් අඩවිය තවදුරටත් විශ්ව විසිරි වියමන තුල නොපවතින නමුත් නිර්මාපිකාවන් විසින් එහි අරමුනු ප්‍රසාරනය කරමින් Clitical.com නමින් නව අඩවියක් තනා ඇත.*